26

තල මල පිපිලා

නාට්‍යය යනු ශ්‍රව්‍ය දෘශ්‍ය කලා මාධ්‍යයකි. එනම් බැලීමෙන් හා ඇසීමෙන් රස විඳින මාධ්‍යයකි. නාට්‍යය වූ කලී බැලීමෙන් රස විඳීමට ඇති කාව්‍ය විශේෂයකි. ඊට දෘශ්‍යය යි කියන්නේ එබැවිනි. නාට්‍යයට රූප හෙවත් රූපක යයි ද කියනු ලැබේ. එය ද එම අර්ථයෙනි. "නළුවෝ ද නිළියෝ ද වෙස් වළා ගෙන අවුත් ප්‍රේක්ෂකයන් ඉදිරියේ කිසියම් අවස්ථාවක් දක්වති. එවිට නාට්‍යයක් පහළ වේ." යනුවෙන් මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර කල්පනා ලෝකය කෘතියේ සඳහන් කරයි. සැබෑ ජීවිත පුවතක් හෝ ගොතන ලද කතාවක් ප්‍රේක්ෂක සමූහයක් ඉදිරියේ චතුර් අභිනය (වාචික - ආංගික - සාත්වික - ආහාර්ය) යොදා ගනිමින් නිරූපණය කිරීම නාට්‍යයක් ලෙස සරලව අර්ථ දැක්විය හැකි ය. එහි මූලික ම කර්තව්‍යය වන්නේ නාට්‍ය පිටපත හෙවත් පෙළ රචනය යි. රචකයා විසින් තමා ලද අත්දැකීමක්, කතා පුවතක් හෝ වෙනත් වස්තු බීජයක් ඇසුරු කරගෙන තම පරිකල්පනය ද ඇසුරින් නාට්‍ය පිටපත රචනා කරයි. "නාට්‍යයක් මුලින් ම රඟ දැක්වෙන්නේ රචකයාගේ සිත නමැති වේදිකාව මත ය." සුප්‍රකට නාට්‍ය රචක බර්නාඩ් ෂෝගේ ඉහත කියමන මෙය තහවුරු කරයි.

අන්දරේලා, (1995 රාජ්‍ය සාහිත්‍ය සම්මාන) ගුරුතරුව (1997 රාජ්‍ය සාහිත්‍ය සම්මාන) සඳගිර, කනේරු මල් ප්‍රවීණ නාට්‍යවේදී ආචාර්ය ජයලත් මනෝරත්න අතින් රචිත නාට්‍ය නිර්මාණ කිහිපයකි. ගල්වඩුරාළ, සිංදුයි බින්දුයි යන ළමා කෘති ද දවස තව තරුණයි නවකතාව ද, වැහි එනතුරු, මිනිහට නින්ද යන්න ඇති යන කෙටිකතා සංග්‍රහ ද ඔහුගේ නිර්මාණ අතර වේ. මේ පාඩමෙහි ඇතුළත් වන්නේ මනෝරත්නගේ තල මල පිපිලා නාට්‍යයෙහි ජවනිකාවකි. නාට්‍ය පිටපත් රචනය පිළිබඳ ඔහු විසින් සම්පාදනය කරන ලද මග පෙන්වීමක් ද මේ පාඩමට ඇතුළත් ය. නාට්‍ය රස වින්දනය, නාට්‍ය පිටපත් රචනය පමණක් නො ව සාම්ප්‍රදායික යෙදුම් භාවිතය පිළිබඳ අවබෝධයක් ද මෙම පාඩම ඇසුරින් ලබා ගත හැකි ය.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

'තලමල පිපිලා' නාට්‍යයේ තේමාව, සම්ප්‍රදාය හා නවීනත්වය අතර ගැටුම යි. නවීකරණය හේතුකොට ගෙන සාම්ප්‍රදායික උරුමයන් ගුණදහම් හා සාරධර්ම, පුරුෂාර්ථ වැනසී යෑමේ අභියෝගයට සමාජය මුහුණ පා ඇති අයුරු නිරූපණය කිරීම යි. මෙම නාට්‍යය සමාජ ගැටලුවක් දෙස නිරීක්ෂණාත්මක විමසුම් බැල්මක් හෙළන නාට්‍යයකි. සමකාලීන අත්දැකීමක් පිටුපස ඇති මානුෂීය ප්‍රබලත්වය විමසන එහි යථාර්ථවාදී ලෙස ජන නැටුම්, ජන ඇදහිලි ආදි සාම්ප්‍රදායික කලාංග ද උපයෝග කර ගෙන ඇත.

දෙවැනි ජවනිකාව

(නුගගහට ඉහළින් සඳ පායා ඇත. රංබරණා සහ හේතු, ගෙයි ඉදිරිපස මිදුලේ වාඩි වී කතා බහේ යෙදී සිටිති.)

රංබරණා: ආරා තල්ගස ගොන් වැඩුණා සේ
මෝරා තලමල එන අන්දන්...
පීරා වරලස අවුල් හරින සේ
තලමල සුළඟට යන අන්දන් ...

හේතු : (එම කවි පද යළි ගයමින්) ලොකු අත්තෙ... ලොකු අත්තා කොහොම ද ඔය තරං ලස්සනට කවි සීපද වන්නං කියන්ට ඉගෙන ගත්තෙ?

රංබරණා : ලොකු අත්තගෙත් අප්පච්චිගෙන්!

හේතු: ඒ අප්පච්චි ඉගෙන ගත්තෙ?

රංබරණා: එයාගෙත් අප්පච්චිගෙන්

හේතු: කිරිමුත්තේ!!

රංබරණා: අන්න හරි... කිරි මුත්තගෙන් තමයි. අත්ත, මුත්තා, නත්තා, පනත්තා, කිත්තා, කිරිකිත්තගෙ ඉඳල ඕවා කටින් කටට ගෙනාපුවා.

හේතු: කිරිමුත්තේ!

රංබරණා: නැටුං ශිල්පෙ විතරක් නෙවී කොල්ලො, ජෝතිසේ, වෙදකම, බලිතොවිල්, කොහොඹ කංකාරි... ඔය ඕනෑ එහෙකට හපන්නු අපේ පරම්පරාව. කන්ද උඩරට කීර්ති ශ්‍රී රාජසිංහ මහ රජ්ජුරුවන්ගෙ දේවින්නාන්සෙට වෙදකං කරල තියෙනව, අපේ මී මුත්තෙක්. ඕවට නම්බු නාම, ගම් බිම්, පදවි තානාන්තර ලබල තියෙනවා.

හේතු: ලොකු අත්තා මොනව ද ඒ කාලෙ කළේ?

රංබරණා: මම! ඒ කාලෙ මං හිටියෙ නෑනෙ පැටියෝ. ඔන්න මං ගැටයා කාලේ නං නේරු අගමැතිතුමා ඉස්සරහ, මහ රැජින ඉස්සරහ, සියං කුමාරයා ඉස්සරහ නැටුං නටල ප්‍රශංසා ලබලා තියෙනවා. බුරුමෙ සියමෙ අපේ මහප්පොච්චිලා ගහපු අඩව් කරණංවලට ඒ රටවල ඇත්තො බලං හිටියයි කියන්නෙ උඩුකුරිඤ්ඤං වෙලාලු. ඔය මේ කාලේ අපේ එවුන් සුද්දො පිටුපස්සෙ ගියාට!

හේතු: ලොකු අත්තට නැටුං ඉගැන්නුවෙ ලොකු අත්තගෙත් අප්පච්චි කිව්වනෙ.

රංබරණා: ඔව්... උඹලගෙ අප්පච්චිට මං ඉගැන්නුව වගේ තමයි. අපේ අප්පච්චි මට ඉගැන්නුවෙ...

හේතු: (කල්පනා කරමින්) එහෙනං අපෙ අප්පච්චි මට නැටුං උගන්නන්නෙ නැත්තෙ?

රංබරණා: (වික්ෂිප්තව කම්පා වෙමින්) ඒ වුණාට හේතුවෝ මං උඹට උගන්නනව නෙ ...

හේතු: අප්පච්චි මට කියනවා, දැං ලොකු අත්තගෙ නැටුං ඉගෙනගත්තා ඇතිලු. අලුත් නැටුං ඉගෙන ගන්ට නුවර හෝටලේට එන්ටලු... අම්මාත් හරියට කරදර කරනවා ලොකු අත්තෙ නුවරට එන්ට කියලා. දැං කීප දවසක් ම ඉස්කෝලෙටත් ආවනෙ. අම්මට හරි පාළුයිලු මං නැතුව.

රංබරණා: ඉතිං ඒකට තියෙන්නෙ අම්මට ඇවිල්ලා මෙහේ උඹත් එක්ක නවතින එකනෙ. බලපං එතකොට උඹට ඉස්කෝලෙටත් ළඟ යි. නැටුං ශිල්පෙ ඉගෙන ගන්ටත් පුළුවං.

හේතු: ඒ වුණාට අම්ම කියන්නෙ මේක අපේ තැනක් නෙවීලු. ලොකු අත්තගෙලු. මෙතන හිටියොත් මාව හරියට හදා ගන්න බැරි වෙනවලු.
(රංබරණා නිහඬව කල්පනාවේ ගැලෙයි.)
අම්මට පිස්සු නේද අත්තෙ?

රංබරණා: උඹට තවම මේවා තේරුං ගන්ට වයස මදි පැටියො. උඹ අහන ඒවට උත්තර දෙන්ටත් මම වයස වැඩියි... නීලකොබෝ සන්දේසෙ තියෙනවා මෙන්න මෙහෙම කවියක්...

එමින් කිරුළු රදහට පොරණ නිලතු රු
කෙළෙන් පසඟ තුරු නද ලැබ ම තනතු රු
බියෙන් නො හැර කරනා විලස අද තු රු
පුහුන් කරති සත මෙහි පසඟ ගොස තු රු

ඔය කවියෙන් කියන්නෙ, පුරාණ කාලෙ ඉඳන්ම තනතුරු ලබා ගෙන, ඒ නරේන්ද්‍රයා වෙනුවෙන් පංචතූර්ය ඝෝෂාව නිරන්තරයෙන් ම කළ හෙයින් නොනවත්තා ම පවත්වන පරිද්දෙන්, එගම වැසියෝ පංචතූර්ය නාදය අද දක්වා ම කර ගෙන එනවාය කියන එක නේ...

හේතු: ඉතිං හැම කෙනෙක්ම ඕවා ඉෂ්ට කරනවා ද?

රංබරණා: නැතුව? අතරගල්ල කොනකලගල ගම්වාසීන්ට ගම්වර දීල තියෙන්නෙ පංචතූර්ය නාදෙට තමයි. අමුණක වපසරිය වෙනුවෙන් සියලු දේවාල ගොඩනැගිලිවල, විහාර මළුවල රාජකාරි කරන්ට ඕනෑ. පෙරහැරේ දී පළිහ, මුතුකුඩේ, උස්සන්ට ඕනෑ. නටන්ට ඕනෑ. තේවාව කරන්ට ඕනෑ.
(රංබරණා නිහඬව කල්පනාවේ ගැලෙයි.)

හේතු: ඔන්න ඔච්චා අමතක කරමු ලොකු අත්තෙ. අපි තවත් කවියක් කියමු ද?

රංබරණා: හ්ම්...! වරෙං!
(රංබරණා නුගගහයට වාඩිගනියි. හේතු හොරෙකු මෙන් බුලත් තට්ටුව වෙත ඇදෙයි.)

හේතු: ලොකු අත්තෙ... මට බුලත්විටක්...!

රංබරණා: දෙනවා උඹට මම විටක්...!

හේතු: අනේ ලොකු අත්තෙ...

රංබරණා: හේතුවෝ ඕවා කෑව ම ඉංග්‍රීසි කියවගන්ට බැරි වෙනවලු.

හේතු: එහෙනං ලොකු අත්ත කන්නේ?

රංබරණා: මම ඉංග්‍රීසි කියනවයැ?

හේතු: මමත් නොකිය ඉන්නවා.

රංබරණා:	එහෙම බෑ නෙ. උඹලගෙ අම්මට උවමනා කරන්නෙ උඹට ඉංග්‍රීසි කියවන්ට නෙ.
හේතු:	අදට විතරක්...!
රංබරණා:	හ්ම්... අදට විතරයි...වරෙං... මේ කවිය සොකරි කතාවේ ගුරුවට වෙච්ච ඇබැද්දියක්.

දේසේ සිට ආ එගුරු මහල්ලා
දියට යන්ට ලබු ගෙඩියක් එල්ලා
තඹරාවිට වෙද රාළගෙ බල්ලා
කාපිලු ගුරුවගෙ කකුලම අල්ලා

සභාපති:	කාගෙ කකුල ද බල්ල හැපුවයි කියන්නෙ?
රංබරණා:	ආ... සභාපති මහත්තයො... නෑ... මේ සොකරි කතාවේ සිද්ධියක් විස්තර කෙරුවා පොඩි එකාට... තඹරාවිට වෙදාගෙ බල්ලා ගුරුවගෙ කකුල කාපු හැටි.
සභාපති:	කාගෙ බල්ලා වුණත් කමක් නෑ... ඉන්ජෙක්ෂන් විසිඑක ගහගන්ට වෙනව වෙනවා ම යි.
රංබරණා:	(අන්දමන්ද වෙමින්) හේතු... උඹට නිදිමත නං ගිහිල්ලා නිදාගනිං! හෙට ඉස්කෝලෙ යන්ටත් එපායැ. (හේතු පිටවෙයි)
සභාපති:	ඔය කොල්ලා මෙතන ම තියා ගන්න ද ගුරුන්නාන්සෙගෙ අදහස?
රංබරණා:	උගේ හපන්කම් විදිහට මෙතනට වඩා ගැළපෙන තවත් තැනක් නෑ ආයිබොවන්ඩ.
සභාපති:	(වාඩිවෙමින්) මෙයා මේ ත්‍රිපිටකෙ වනනවා! මෙහෙ නෙවෙයි... ඔය ළමයි යවන්ට ඕන රට. කොච්චර දේවල් තියෙනවා ද ඉගෙන ගන්ට. මගේ හිතේ විශාල වේදනාවක් තියෙනවා. මේ කොට්ඨාසෙ ළමයින්ගෙ හපන්කම්වලට තැනක් නැති වීම ගැන. සුදු මහත්තයත් එක්ක එකතු වෙලා ඒ වාගේ ළමයි රට යවන්න පිළිවෙළක් හදන්නෙ ඒකයි මේ තරං වද විඳ ගෙන.
රංබරණා:	රට යවන්ට? මේ... මේ... පොඩි ළමයි?
සභාපති:	ගුරුන්නාසේ මම මේ කියන්නේ ළෙන්ගතුකමට. මේ බිත්ති හතරෙන් එහා තියෙනව තවත් ලෝකයක්. අර තියෙන්නෙ... “ලෙන තුළ සිරවී සිටි කුමරුන් දා ලොව බැලුමට ලොල් වී ලෙන බින්දා” කියලා... ගල් ලෙන බිඳ ගෙන ලු ගියා කියන්නෙ... කවුද මේ. මනමේ කුමාරයා.
රංබරණා:	ම...න...මේ කුමාරයා නෙවී... එහෙම ලෙන බිඳ ගෙන ගියා කියන්නේ සිහබා කුමාරයා.
සභාපති:	ආ... මිනිහත් ගියා ද? වෙන්ටැති වෙන්ටැති.
රංබරණා:	එහෙම බිඳ ගෙන යන්ට ලෙනක් මෙතැන තියේවි යැ?
සභාපති:	ලෙනක් නැති වුණාට මේ රුස්ස නුගේ මදැයි. ඔය නුගේ කළුවර හෙවණැල්ලෙන් ගුරුන්නාන්සෙගෙ ඇස් අන්ධ වෙලා. අනිත් අයගෙත් ජීවිත කොටු වෙලා.
රංබරණා:	පරම්පරා ගණනාවක නෙත් පාදපු මේ උත්තම වෘක්ෂරාජයා ගැන ඔහොම

කතා කරන්ට එපා. ආයුබොවන්ඩ...

සභාපතිඃ නෑ... නෑ... මම කතා කරන්නෙ නෑ... මම කතාකරන්නෙ නෑ... අපි ගහක් ගැන කතා කෙරුවත් මිනිස්සු හිතන්නෙ වෙන දෙයක්. (තමාටම) අනික නුග ලී මොනවට ගන්ටද මට?... ගුරුන්නාන්සෙ! මම මේ තකහනියක් ම රාත්‍රියෙ ගෙට ගොඩ වුණේ වැදගත් රාජකාරියකට... මට ඔත්තුවක් ලැබිලා තියෙනවා මේ රංගසභාවෙ ඉන්නවයි කියලා... මේ...

(ගෙතුළින් හේතුගේ කටහඬ ඇසෙයි.)

රංබරණාඃ අනේ සභාපති මහත්තයෝ... පොඩි එකා හීනෙං බය වෙලා ද කොහෙද? ළඟ නො හිටියොත් එහෙම ම යි. වාඩි වෙලා ඉන්ට...

(රංබරණා ගෙතුළට දිව යයි. සභාපති වාඩි වී සිටිත් ම ගුණවංශ පිවිසෙයි.)

සභාපතිඃ මුන්නැහෙ?

ගුණවංශඃ (මඳ සැකයෙන් යුතුව) මම මේ ගුරුන්නාන්සෙ හම්බු වෙන්ට කියල.

සභාපතිඃ මේ පළාතෙ ද?

ගුණවංශඃ මම දකුණෙ

සභාපතිඃ අපිත් දකුණෙ...

(මඳ නිහඬතාවක්)

මම තමයි මේ කොට්ඨාසෙ සභාපති... මේ ඇ?

ගුණවංශඃ හුඟ දවසක් වෙනව ගුරුන්නාන්සෙ මට පණිවිඩයක් එවලා. බෙර ගෙඩියක් දෙකක් හදා ගන්ට ඕනෑ කියල. අපේ ගම් පළාතෙ තියෙනවනෙ ඇහැල... ගංසූරිය... කොහොඹ කොට...

සභාපතිඃ අප්පච්චියේ ඔච්චර දුර යන්ට ඕනෑයැ මේ පුංචි බෙරේකට?

ගුණවංශඃ බෙරේ පුංචි වුණාට වැඩේ ලොකුයි සභාපති මහත්තයෝ. ගුරුන්නාන්සෙත් බොහොම අමාරුවෙන් නෙ මේ වැඩ ටික කර ගෙන යන්නෙ. අවුරුදු දහයකට ඉස්සර ගැටවැල් ලණුවක් සත විසි පහ යි. අද රුපියල් හැත්තෑපහ යි. හංකඩ කැල්ලක් රුපියල් සීය යි.

සභාපතිඃ හංවල ගණකම ඈ...?

ගුණවංශඃ ඒ විතරක් නෙවී. මුව හං වඳුරු හං හොයන්ට ඕනෑ. කොහොම හරි අමාරුවෙන් හොයා ගත්තයි කියමුකො. කැලේ ඉඳල ගෙනෙද්දී පොලිසියට එහෙම අහු වුණොත් හමයි කොටෙයි දෙක ම නෑ.

සභාපතිඃ දැං තියෙනවනෙ ඉතිං අපි ගෙන්නලා හොඳ ඉම්පෝර්ටඩ් ප්ලාස්ටික් ලණු!

ගුණවංශඃ ඒවා හොඳයි නාහෙට දාන්ට... (බෙරයට තට්ටු කර) බෙරේ නියම නාදෙ ගන්ට නම්, නියම හම් නියම කොටේ අහු වෙන්ට ඕනෑ. නැත්තං සද්දෙ බැල් බැල්. අපි ඉතිං මේ වගෙ තැන්වලට උදව් කරන්ට එපා යැ.

සභාපතිඃ නැතුව නැතුව... කන්ද උඩරටෙයි කිය කියා හිටියට අපේ උදව්ව නැතිව බෑ. ඇත්ත ම කියනව නං අපිත් දෙනවා ආධාර ඔය කලායතනවලට. ඒ වුණාට මේ කලායතනවල තියෙන්නෙ පුදුම මැජික්, පැමිණීම විසිහත යි. පැමිණීමේ පොතේ විසිහතරදාස් හාරසීය දෙක යි නම්. ඉතින් දෙන ආධාරෙත් අන්තිමේ අනාථාධාරෙ!

ගුණවංශඃ හුඟ කලායතන එහෙම වුණාට මෙතන නම් එහෙම තැනක් වෙන්ට බෑ...

සභාපති:	විකාර! අපි ඔහෙලා දකුණෙ වුණාට අපෙ කනිනුත් රිංගනව මේ ගොල්ල. මං සුදු මහත්තයෙකුත් එක්ක එකතු වෙලා සැලසුම්කරලා තියෙනවා ෂෝක් වැඩ පිළිවෙළක්. අලුත් ම සම්ප්‍රදායක් අද හෙට ම බිහිකරන්ට.
ගුණවංශ:	(වික්ෂිප්ත වෙමින්) අලුත් ම සම්ප්‍රදායක්!
සභාපති:	ඔව්!
ගුණවංශ:	අද හෙට ම!
සභාපති:	ඔව්!
ගුණවංශ:	සමා වෙන්ට... පැෂන් එන එන තාලෙට ඇඳුම් මාරු කරනවා වගේ කාලෙන් කාලෙට පුළුවන් ද සභාපති මහත්තයෝ සම්ප්‍රදාය වෙනස් කරන්ට?
සභාපති:	කවුද බෑ කියන්නේ? නෑ බෑ වචන මගෙ ළඟ නෑ.
ගුණවංශ:	නෑ?
සභාපති:	නෑ
ගුණවංශ:	එහෙනං ඔය නෑ කිව්වෙ?
සභාපති:	හදිස්සියකට ගන්ට එකක් දෙකක් තියෙනවා...? දැං බලන්ට මුළු ඉතිහාසෙ පුරා ම වෙනස්කම් කරපු නිසා තමයි අපි අද මේ තරං සෞභාග්‍යයෙන් ඉන්නෙ. සම්ප්‍රදාය අන්න ඒ වගේ වෙනස් කරන්ට ඕනෑ.
ගුණවංශ:	මේ කාලෙ විද්‍යාවෙ දියුණුවෙන් සකස් වෙච්චි සංස්කෘතියක ජීවත් වුණාට ගුරුන්නාන්සෙගෙ මුල් තියෙන්නෙ ප්‍රවේණි වැඩවසම් කාලෙ. ඉතිං වෙනස්කම් කරන්ට ඕනෑ බුද්ධිමත්ව හෙමින්.
සභාපති:	මේ කාලෙ හෙමින් ගියොත් පරාදයි. දැං බලන්ට අපේ මනුස්ස ශිෂ්ටාචාරෙ. ඉස්සරෝම ගල්යුගේ. ගල එපා වුණා ම එඬේර යුගය. එතැනින් ගොවිතැන. අන්තිමේ කාර්මික යුගය. (රහසින් මෙන්) තව අවුරුදු ගණනාවකින් උපදිනවලු කොම්පියුටර් යුගය. රොබට්වරුන්ගෙ. ඉතිං මේ දියුණුව ලැබුණෙ කා නිසා ද? වෙනස් වීම්වලට හැඩ ගැහුණු නිසා.
ගුණවංශ:	දැං ඔය කවුරු දියුණු වෙච්ච කතාව ද සභාපති මහත්තයා කියන්නෙ?
සභාපති:	අපි! (හදිසියේ සිහිපත් වී) නෑ...මේ... අපි ඔහෙලා!
ගුණවංශ:	අපේ අත්තා මුත්තා ගොයිතැං බතක් කරගෙන, කොයිතරම් සරල ජීවිතයක් ද ගත කළේ. ඒ විතරක් ද? සිල්ප සාත්තරේ හදාරනව. සම්භාව්‍ය කලා කෘති, සාහිත්‍ය කෘති නිර්මාණය කරන්ට වෙලාව ඉතුරු කර ගත්තෙ නැද්ද? අද කෝ ඒ විවේකය? එදා ඉඳල මේ කාර්මික යුගයට එනකල් ඔය කියන දියුණුව වුණා නම්, අපි හැමෝටම තියෙන්ට එපා යැ ඒ වගේ සිය ගුණයක විවේකයක්. නිස්කලංකයක්. හරියට නිකං බොත්තම එබුවම ඔක්කොම කෙරෙනව වගේ.
සභාපති:	කවුද නෑ කියන්නෙ? දැං බලන්ට මගෙ කාරෙක. බොත්තමක් ඔබපු ගමන් දොර ඇරෙනව. තව එකක් එබුවම ස්ටාර්ට් වෙනවා. අනික් බොත්තමට මෙන්න ඉගිලෙනව.
ගුණවංශ:	බොත්තමක් තියා කාසයක් මහගන්න නූල් පොටක් නෑ හුඟ දෙනෙකුට. සේරමලා වලිග ගිනි ගත්තු හනුමලා වගේ දුවනව, උදේ හිට රෑ වෙනකල් ජීවිතේ කරවන්ට. ඒත් අනිතිමට දොඩං ගොඩ බදා ගත්තා වගේ ඉතුරු වෙන පිච්චියකුත් නෑ.

සභාපති:	අන්න ඔය සමාජ අසාධාරණය, අසමතුලිතතාව, අසමජ්ජාති බව නැති කරන්ට තමයි, මම මේ රංග සභාවෙන් පටන් ගන්ට යන්නෙ, අලුත් ම සම්ප්‍රදායක්. බලන්ට මේක ක්‍රියාත්මක කළා ම දොඩං ගෙඩි කීයක් අතේ ඉතුරු වේවි ද කියල. (රංබරණා පැමිණෙයි)
රංබරණා:	ආ...! මේ ළමයත්. (තමා අඳුන්වා නො දෙන ලෙසට ගුණවංශ ඉඟි කරයි.)
සභාපති:	ළමයා නිදා ගත්ත ද?
රංබරණා:	ඔව්... ඒ ළමයත් නිදා ගත්තා.
සභාපති:	ගුරුන්නාන්සේ මගෙ වෙලාව පැන්නා. මම වෙන දවසක ගොඩවෙන්නං. (පිට වී යාමට සූදානම් වෙයි.)
රංබරණා:	සභාපති මහත්තයා මොනවත් කනව ද?
සභාපති:	න්...නෑ... මම මේ කෑමකට යන ගමන්. ගිහින් එන්නං හොඳේ. (සභාපති පිටව යයි.)
ගුණවංශ:	මිනිහට බඩගිනි නැතිව ඇති. මෙච්චර වෙලා ම සම්ප්‍රදාය කෑවා. (අඳුර ගලයි)

අත්දැකීම් හා නාට්‍ය පිටපත් රචනය

-ආචාර්ය ජයලත් මනෝරත්න-

නාට්‍යයක පෙළ හෙවත් පිටපත් රචනය වෙනත් සාහිත්‍ය නිර්මාණ මෙන් ම ලේඛන කාර්යයකි. එහෙත් වෙනත් රචනා මෙන් නාට්‍ය, පෙළ ලිවීමෙන් පමණක් නතර නො වීම විශේෂ ලක්ෂණයකි. අත්දැකීමක් කලාත්මකව, වචන, වාක්‍ය, සංවාද, පද්‍ය ඇසුරෙන් කවිය, කෙටිකතාව, නවකතාව මාර්ගයෙන් පාඨකයාට කෙළින් ම පැවසිය හැකි වුවත් නාට්‍යය රචකයාට හුදෙක් භාෂාව මාර්ගයෙන් පමණක් රස නිපැයීමට ඉඩක් නො ලැබේ. එයින් පූර්ණ රසයක් නො ලැබෙන බැවිනි.

නිතර ශ්‍රවණය වන නාට්‍යය හා රංග කලාව යන වචන දෙක ඇසුරෙන් මෙය පැහැදිලි කළ හැකි ය. නාට්‍යය යනු පෙළ රචනා කිරීම වන අතර, රංග කලාව යනු එම පෙළ ඇසුරු කර ගනිමින් වේදිකාව මත ගොඩ නැගෙන කලාත්මක ප්‍රයත්නය යි. නාට්‍ය රචකයා ලියන්නේ වාර්තාවක් හෝ යම් සංසිද්ධියක් ගැන තොරතුරක් හෝ නො වේ. සජීවී නළු නිළියන්ගේ මුවට නංවා අර්ථය උද්දීපනය කොට පළ කරවන, සංවාද හෝ කවි ගී රචනා මෙන් ම යම් නාටකීය අවස්ථාවක් ගොඩ නංවා ගැනීමට උපකාරී වන දර්ශන, ජවනිකා අංක ආදිය හා බැඳුණු රංගෝචිත කතා වස්තුවකි.

"නාට්‍යය වූ කලි කෙනෙකුගේ සිතෙහි පහළ වන නිර්මාණාත්මක ප්‍රපංචයකි." යනුවෙන් මහාචාර්ය ඇලඩයිස් නිකොල් පවසයි. එය වචන ඔස්සේ සංවාදයට පෙරළී වේදිකාව මත ජීවය ලබයි. මෙහි වචන යනු එකකි. සංවාද යනු තවත් එකකි. සියලු ම වචන සංවාදවලට නො ගැළපේ. ඒ නිසා 'නාට්‍යෝචිත භාෂාව' යන්න අප සොයා යා යුතු ය. විශිෂ්ට ගණයේ නාට්‍ය රචනයක අඩංගු වචන, අඩු හෝ වැඩි හෝ නැත. එක ද වචනයක්වත්

ඉවත් කළ නො හැකිවා සේ ම අලුතෙන් එකතු කළ නො හැකි ය. සුගතපාල ද සිල්වා නාට්‍යවේදියා "නාට්‍ය රචකයා වචන භාවිත කළ යුත්තේ මසුරකු ලෙස ය." යනුවෙන් ප්‍රකාශ කර ඇත්තේ එබැවිනි. නාට්‍යය යනු "වෘත්තාන්තමය වශයෙන් කතාවක් කීම හෝ කාර්යයන් ඔස්සේ වස්තුවක් විකාශය කිරීම" යනුවෙන් ද සුගතපාල ද සිල්වා විසින් විස්තර කර ඇත. නාට්‍යයක් රචනා කරන්නේ නිවී සැනසිල්ලේ තමාට ම කියවා ගෙන රහසේ රස විඳීමට නො වේ. සංවාද, ගීත, කවි උච්චස්වරයෙන් අර්ථාන්විතව ස්වර හා තාලානුකූලව බොහෝ දෙනාට ශ්‍රවණය කිරීමට හැකි වන ලෙස දෙඩීමට හා ගැයීමට යි.

ගැඹුරින් විමසන විට නාට්‍ය රචනය සාහිත්‍යමය ක්‍රියාවලියක් වුවත් නාට්‍ය රචකයා සාහිත්‍යකරුවකු මෙන් ම නාට්‍යකරුවෙක් ද වේ. ඔහු පිටපත රචනා කරන්නේ කියවීමට පමණක් නො ව රඟපෑමට ද සමග ය. එය මේසය මත තබා ලියූව ද කරලිය මත ප්‍රාසංගිකව සජීවීව මැවීමටත් හැකියාව තිබිය යුතු ය. 'නාට්‍යය මුලින් ම රංග ගත වන්නේ රචකයාගේ මනස් කරලියේ ය' යන කියමන ගොඩ නැගී ඇත්තේ ඒ නිසා ය.

නාට්‍යයක් රචනා කිරීමට අත්දැකීමක් පාදක විය යුතු ය. එය තම අත්දැකීමක් හෝ උපකල්පනය කරනු ලැබූ අත්දැකීමක් විය යුතු ය. ගොඩනැගිල්ලක් තැනීමට වාස්තු විද්‍යාඥයකු උපදෙස් දෙන්නේ ගෘහ නිර්මාණ ශිල්පියා විසින් නිර්මාණය කරනු ලැබූ ගෘහ නිර්මාණ සැලසුමට අනුව ය. එලෙස නාට්‍ය අධ්‍යක්ෂවරයා නාට්‍යය නිෂ්පාදනය කිරීමට උපයෝගි කර ගන්නේ රචකයා විධිමත්ව පිළියෙල කළ නාට්‍ය පිටපත යි.

නාට්‍යයේ පෙළට පාදක වන්නේ යම් කතා පුවතකි. සංස්කෘත නාට්‍යයේ දී ඉතිවෘත්තය ලෙස හඳුන්වා ඇත්තේ මේ කතා පුවත යි. (ඉති - මෙසේ, වෘත්ත - සිදු විය) භරතමුනි පඬිවරයා ද නාට්‍යයේ ශරීරය ඉතිවෘත්තය ලෙස සඳහන් කරයි. ඉතිවෘත්තය ඉතිහාස පුවතක්, ජනශ්‍රැතියක්, ජනප්‍රවාදයක්, පුරාණෝක්තියක්, සමකාලීන සමාජ අත්දැකීමක් හෝ විය හැකි ය. නිදසුන් ලෙස මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය කීපයක් විමසා බලන්න. **මනමේ, වෙස්සන්තර, මහාසාර, බව කඩතුරාව, ලෝමහංස, කදා වළලු, පබාවතී** වැනි නාට්‍ය ජාතක කතා ඇසුරිනුත්, **රත්තරං, එලොව ගිහිං මෙලොව ආවා, වෙල්ලවැහුං** වැනි නාට්‍ය ජන කතා ඇසුරිනුත්, **සිංහබාහු නාට්‍යය** වංශ කථාගත ප්‍රවාද ඇසුරිනුත් නිර්මාණය කර ඇත. **කිරිමුට්ටිය ගඟේ ගියා, වටපුළුවේ ගෙවල් බිඳලා** වැනි නාට්‍ය සමකාලීන සමාජ අත්දැකීම් පාදක කර ගෙන ඇති අතර **කපුවා කපෝති, මඟුල් ප්‍රස්තාව** වැනි නාට්‍ය විදේශ කෘති ඇසුරෙන් ද නිර්මාණය කර ඇත.

තලමල පිපිලා නාට්‍යයට පාදක වී ඇත්තේ අපගේ සමකාලීන සමාජ අත්දැකීමකි. මා ඉපදී ළමා කාලයේ වාසය කළේත් පාසල් ගියේත් කන්ද උඩරට පිටිසර ගම්මානයක ය. මා පුංචි කාලයේ ගමේ රඟ දක්වන ලද සොකරි, කිඳුරු ගැමි නාටකත් ඒවායෙහි රඟ පෑ ගැමියනුත් ගමේ විහාරයේ තේවාව කළ ගුණයා, රංබරණා, සේදරමා ආදි වැඩිහිටියනුත් පමණක් නො ව ගම ද විශාල වෙනසකට ගොදුරු වී තිබුණු බව විශ්වවිද්‍යාල ජීවිතය හා රැකියා ජීවිතය නිම කර ආපසු ගමට ගිය මා ලැබූ එක්තරා අත්දැකීමකි.

විශේෂයෙන්ම කලාන්තරයක් මුළුල්ලේ පරම්පරානුගතව ශේෂ වී තිබුණු සිංහල සංස්කෘතික දායාද නවීකරණය, බටහිරීකරණය ඉදිරියේ විශාල වෙනස් වීම්වලට භාජනය වන ආකාරය මේ නාට්‍යයට පාදක වූ තේමාව යි. ඇස් පනාපිට දක්නට තිබුණු, පුළුල් වපසරියක විහිදුණු මෙම ඛේදවාචකය ඇසුරෙන් එක් ගැමි පවුලක් කේන්ද්‍ර කොට ගෙන චරිත කීපයක්

ගොනු කර ගනිමින්, නාට්‍යෝචිත සිදුවීම් පෙළ ගස්වමින්, සංකේතාත්මකව නාට්‍ය රචනය නිර්මාණය කර ගැනීමට හැකි විය.

රංබරණ ගුරුන්නාන්සේ අපගේ පාරම්පරික චින්තනයත්, බාල බංඩාර දෙවැනි පරපුරේ නවීකරණයත් ඔකනල් බටහිරකරණයත් ගුණවංශ රැඩිකල් වාමාංශිකයත් සභාපති අධිපති දේශපාලන ව්‍යූහයත් මහේෂිකා ජනප්‍රිය සංස්කෘතියත්, හේතු තම අක්කාගේ සංවේදනය වටහා ගත්තා වූ තුන්වැනි පරපුරත් ආදි වශයෙන් මෙහි චරිත සංකේතාත්මක ලෙස ගොඩ නැඟීමට හැකි විය.

නාට්‍ය පිටපතක් රචනා කිරීමේ දී පහත දැක්වෙන ලක්ෂණ අන්තර්ගත විය යුතු ය.

(10 ශ්‍රේණියේ පෙළ පොතෙහි 14 පාඩමෙහි නාට්‍ය පිටපත් රචනය කොටස ද උපකාරී කර ගන්න.)

- නාට්‍ය පිටපතට සුදුසු තේමාව
- තේමාව ඉදිරිපත් කිරීමට සුදුසු කතා වස්තුව
- පාඨකයාට/ප්‍රේක්ෂකයාට දෙන පණිවිඩය/ජීවන දෘෂ්ටිය/අරමුණ
- අරමුණ කරා යෑමට සිද්ධි, පෙළ නිර්මාණය
- නාට්‍යයේ කාලයට අනුරූප කතා වින්‍යාසය
- උක්ත ශෛලියක් (ශෛලිගත/ස්වාභාවික)
- නාට්‍යයේ සන්දර්භයට (ආරම්භය - විකාශය - උච්ච අවස්ථාව - නිරාකරණය) අනුව
- ජවනිකා අංක
- එහි නිරූපිත චරිත ගණන
- කතා වස්තුවෙහි නාට්‍යයට උචිත අවස්ථා හඳුනා ගැනීම
- ශෛලිගත නාට්‍ය පෙළෙහි ගැටුම් අවස්ථා යොදා ගැනීම
- චරිත හා ගැටුම්වලට අදාළ වාග් විලාසය හා සංවාද
- රංග විධාන යොදා ගැනීම
- නාට්‍යයේ නිමාව (සුඛාන්ත/දුඃඛාන්ත)

අවබෝධය

1. **පෙර දැනුම සහ මෙම පාඩම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.**

   i. නාට්‍ය කලාව සාමූහික කලා මාධ්‍යයකි. ඊට හේතු දක්වන්න.
   ii. නාට්‍යය සජීවී කලා මාධ්‍යයක් වීමට හේතු 3ක් දක්වන්න.
   iii. නාට්‍යෝචිත අවස්ථා යනු මොනවා ද?
   iv. 'තලමල පිපිලා' නාට්‍යයට පාදක කර ගෙන ඇති අත්දැකීම හා එහි තේමාව කුමක් ද?
   v. i. පාඩමේ ඇතුළත් කොටසෙහි සඳහන් වන චරිත නම් කරන්න.
      ii. ඒ එක් එක් චරිතයෙන් සංකේතවත් කර ඇත්තේ මොනවා දැයි වෙන් වෙන්ව දක්වන්න.

ලිඛිත අභ්‍යාස

1. **සුදුසු පරිදි යෙදුම් තෝරා හිස්තැන් සම්පූර්ණ කරනන.**

   i. නාට්‍යයක් නරඹා රස විඳින්නා .... ලෙස හැඳින්වේ.
   ii. යම් ක්‍රියාවක් හෝ අවස්ථාවක් හෝ .... කර දැක්වීම නාට්‍යය නම් වේ.
   iii. නාට්‍ය නිර්මාණයක මූලික කාර්යය ....යි
   iv. නාට්‍යයක සාර්ථකත්වය උදෙසා .... උපකාරී වේ.
   v. සිංහබාහු නාට්‍යය .... ඇසුරින් නිර්මාණය වී ඇත.
   vi. තලමල පිපිලා .... නාට්‍ය ශෛලියෙන් නිර්මාණය වූවකි.

   (අභිනය, පෙළ රචනය, නාට්‍යෝචිත භාෂාවක්, ප්‍රේක්ෂකයා, ස්වභාවික, වංශකතාවක්, අනුකරණය, පාඨකයා)

2. **පහත සඳහන් වචන යොදා අර්ථවත් වාක්‍යය බැගින් ලියන්න.**

   i. පාඨකයා
   ii. ශිල්පීය ක්‍රම
   iii. පරිකල්පනය
   iv. සම්භාව්‍ය
   v. සාම්ප්‍රදාය

ප්‍රායෝගික අභ්‍යාස

1. **තලමල පිපිලා නාට්‍ය පිටපත කියවන්න.**
2. **ඔබ දන්නා සිංහල නාට්‍ය පහක නම් ලියන්න. ඒවායෙහි පාදක කර ගෙන ඇති අත්දැකීම් හා ශෛලීන් කවරේ දැයි දක්වන්න.**
3. **පහත දී ඇති උපමා කතාව උපයෝගි කර ගෙන කෙටි නාට්‍ය පිටපතක් නිර්මාණය කරන්න.**

   පාසල් ගිය දරුවෙක් දවසක් තම පන්තියේ යහළුවකුගේ පොතක් සොරකම් කර ගෙන ගෙදර ගියා. ඔහුගේ මව එය දැක සතුටුව පුතාට ප්‍රශංසා කළා. මේ නිසා ඔහු නිරතුරුව මිතුරන්ගේ බඩු සොරකම් කිරීම දිගට ම කර ගෙන ගියා. තරුණයෙකු වූ පසු ඔහු අසල්වැසියන්ගේ විවිධ දේ සොරකම් කරන්නට වුණා. ඒ එකකටවත් මව විරුද්ධ වුණේ නැහැ. දවසක් ලොකු සොරකමකට ගිය විට ඔහු අතින් මිනිසෙකු මිය ගියා. මේ නිසා ඔහුට මරණීය දණ්ඩනය නියම වුණා. දිනක් මව තම පුතා බැලීමට ගියා එවිට මවට ළං වුණු පුතා මවගේ කන සපා කෑවා. ඒ නපුරු ක්‍රියාවට මව දොස් පැවරුවා. එවිට තරුණයා "මම මුලින් ම පොත සොරකම් කර ගෙන ආ වේලාවේ මට දඬුවම් කළා නම් අද මට එල්ලුම් ගහට යන්න වෙන්නේ නෑ' කියා මවට දෝෂාරෝපණය කළා.

4. **ඔබ කැමති ජන කතා, ජාතක කතා හෝ වෙනත් අත්දැකීම් ඇසුරෙන් නාට්‍ය පිටපත් රචනා කරන්න.**

සාම්ප්‍රදායික යෙදුම්

ඕනෑ ම කතාවක් සතුව ඊට උරුම වූ භාෂා සම්ප්‍රදායක් පවතී. එම භාෂාව නියෝජනය කරන සමාජය තුළ පවත්නා ජීවන වෘත්තීන්, සිරිත් විරිත්, ඇදහීම්, සිතුම් පැතුම්, ආකල්ප ආදිය මත භාෂා ව්‍යවහාර හෙවත් සාම්ප්‍රදායික යෙදුම් ගොඩ නැගේ. සිංහල භාෂාවේ භාවිත මෙම ඇතැම් සාම්ප්‍රදායික යෙදුම්වලට වසර දහසකට වඩා ඉතිහාසයක් ඇත. මතුපිට අර්ථය ඉක්මවා යන අමුතු ව්‍යවහාරයක් මේ යෙදුම්වල ඇත.
ව්‍යවහාරයේ දී මෙන් ම ලේඛනයේ දී ද පළ කළ යුතු අදහස ඉතා රසවත් වූ හා සිත් ගන්නා ලෙස ඉදිරිපත් කිරීමේ හැකියාවක් මේ යෙදුම් නිසා ඇති වේ.

මේ සම්ප්‍රදායික යෙදුම් වර්ග කීපයකි.

1. ප්‍රස්තාව පිරුළු
2. රූඪී
3. යුගල පද

ප්‍රස්තාව පිරුළු

'අවස්ථාවට උචිත අයුරින් යොදන කියමන' යන අරුතින් ප්‍රස්තාව පිරුළු නම් වේ. සිංහල ශබ්දකෝෂය පිරුළු හඳුන්වන්නේ 'තැනට ගැළපෙන කියමනකි, ආදර්ශවත් කීමකි, ආප්තෝපදේශයකි.' යනුවෙනි.
නාට්‍ය කොටසෙන් උපුටා ගත් පහත යෙදුම් කියවන්න.

"එදා ඉඳලා මේ කාර්මික යුගයට එනකල් ඔය කියන දියුණුව වුණා නම් අපි හැමෝට ම තියෙන්න එපා යැ ඒවාගෙ සිය ගුණයක විවේකයක්, නිස්කලංකයක් හරියට නිකං **බොත්තම එබුවම ඔක්කොම කෙරෙනව වගේ.**

බොත්තමක් තියා කාසයක් මහ ගන්ට නූල් පටක් නෑ, හුඟ දෙනෙකුට. සේරමලා **වලිගෙ ගිනි ගත්තු හනුමලා** වගේ දුවනව උදේ හිට රෑවෙනකල් ජීවිතේ ජීවත් කරවන්ට.

ඒත් අන්තිමට **දොඩං ගොඩ බදා ගත්ත වගේ** ඉතිරි වෙන පිච්චියකුත් නෑ.

පළමු පාඨයෙහි කියවෙන අරුත් විමසා බලන්න.

විද්‍යාත්මක, තාක්ෂණික වශයෙන් ලෝකය කොතෙක් දියුණු වූවත් මිනිසාට විවේකය අඩු වී ඇති බව තහවුරු කිරීමට රචකයා එම පිරුළ අවස්ථාවට උචිත ලෙස යොදාගෙන ඇත. දෙවන පාඨයෙහි ඉතා දැඩි ආර්ථික සටනක යෙදෙන්නට මිනිසාට සිදු වී ඇති අයුරු දැක්වීමට **'වලිගෙ ගිනි ගත්තු හනුමලා වගේ'** යන පිරුළ උපකාර කර ගෙන ඇත.

කෙතෙක් වෙහෙස වුව ද අවසානයේ කිසිදු ප්‍රතිඵලයක් අත් නොවුණ බව පැවසීමට **'දොඩම් ගොඩ බදා ගත්ත වගේ'** යන පිරුළ දක්වයි.

යම් කියමනක අරුත ඉතා හොඳින් පැහැදිලි කොට ප්‍රාණවත් ලෙස ඉදිරිපත් කළ හැකි බව ඉහත පාඨවලින් තහවුරු වේ.

ප්‍රස්තාව පිරුළුවල දී, ඉතිහාස ගත සිදුවීමක්, ජන කතාවක්, ජාතක කතාවක්, පුරාවෘත්තයක්, පුද්ගල චරිතයක් සම්බන්ධ සිද්ධියක් ආදි වශයෙන් උපකාරි විය හැකි ය. එමෙන් ම ප්‍රස්තාව පිරුළු තුළ සාමාන්‍ය ප්‍රකාශයක්, උපදේශයක් හෝ උපමාවක් වශයෙන් ද ව්‍යවහාර වනු දක්නට ලැබේ. පිරුළ, සැකසී ඇති ස්වභාවය අනුව ද විවිධ වේ. සමානවාචී ප්‍රකාශනමය, ප්‍රශ්නමය, අවවාදාත්මක, විධානමය, රිද්මානුකූල ආදි වශයෙන් විවිධ ආකෘති ඒ තුළ හඳුනා ගත හැකි ය.

අන්දරේ සිනී කෑව වගේ	උපක්‍රමශීලීව තම අදහස ඉටුකර ගැනීම
අබරා සිල් ගත්ත වගේ	අනවබෝධයෙන් යමක් කිරීම
පරංගියා කෝට්ටේ ගියා වගේ	කෙටි මගකින් යා හැකි ව තිබිය දී දුර මගකින් යාම
කලුවා මාරපන් ගියා වගේ	අරමුණකින් තොරව වැඩක් කිරීමේ නිෂ්ඵල බව
ඉබ්බන්ගෙන් පිහාටු ඉල්ලුව වගේ	ලබා ගත නො හැකි දෙයක් වෙනුවෙන් මෙහෙයවීම
අත දීල දත තියවනව වගේ	උදව්වක් කර යමක් බලාපොරොත්තු වීම
වක්කඩේ හකුරු හැංගුව වගේ	සුදුසු රැකවරණයක් නැති වීම
ගුරුන්ටත් අකුරු වරදිනවලු	කා අතිනුත් වැරදි සිදු වන බව
එළිපත්ත උඩ ඉන්න බළල වගේ	ස්ථිර තීරණයක් නැති බව
ඔංචිල්ලාව එහාට ගියත් මෙහාට එනවලු	ඕනෑ ම ක්‍රියාවකට යම් ප්‍රතික්‍රියාවක් ද ඇති බව

රූඩී

යම් යෙදුමකට ඇතුළත් වචනවල අර්ථය ඉක්මවා යන වෙනත් අර්ථයක් ප්‍රකාශ වේ නම් එය රූඩීයක් ලෙස හැඳින්වේ. අර්ථය ඉඟියකින් ගත යුතු නිසා 'ඉඟි වැකි' ලෙස ද ඒවා හැඳින්වේ. මේවා ඉතා කෙටි යෙදුම් විශේෂයකි. පවසන දෙය ඉතා රසවත්ව හා අවධානය ඇති වන ලෙස කීමටත්, ලිවීමටත් රූඩී නිසා හැකියාව ලැබේ.

"අපේ මහප්පොච්චිලා ගහපු අඩව් කරණම්වලට ඒ රටවල ඇත්තො බලං හිටියයි කියන්නේ, **උඩුකුරිඤ්ඤං වෙලාලු**. ඔය මේ කාලෙ එවුං සුද්දෝ පිටු පස්සේ ගියාට"
"මෙයා මේ ත්‍රිපිටකය වනනවා. මෙහේ නො වෙයි...
ඔය ළමයි යවන්න ඕන රට..."
"ඔය නුගේ කළුවර හෙවණැල්ලෙන් ගුරුන්නාන්සෙගෙ ඇස් අන්ධ වෙලා"
"උඩුකුරිඤ්ඤං වෙලා" යන රූඩීයෙන් අපේ මුතුන් මිත්තන් දැක්වූ දක්ෂතා දෙස සුදු ජාතිකයන් විස්මයෙන් යුතුව බැලූ අයුරු කියැවේ.
"ත්‍රිපිටකය වනනවා" යන්නෙන් ධර්මයට අනුව සම්ප්‍රදායානුකූල අදහස් සහිතව ජීවත් වන බව කියැවේ. නවීකරණය විය යුතු බව සභාපතිගේ අදහසයි.
"ඇස් අන්ධ වෙලා" යන්නෙන් යථාර්ථය යටපත්ව ඇති බව කියැවේ.
මෙලෙස රූඩී භාවිතයෙන්, පවසන අදහස ඉතා රසවත්ව හා සජීවී ලෙස ඉදිරිපත් කළ

හැකි ය.
පහත යෙදුම් කියවන්න.

දිනන පක්ෂය බලා **එයට එකතු** වීම අවස්ථාවාදීන්ගේ සිරිත යි.

දිනන පිළට කොඩිය දීම අවස්ථාවාදීන්ගේ සිරිත යි.

විභාග ප්‍රතිඵල එනතුරු අක්කා **ඉමහත් බලාපොරොත්තුවෙන්** සිටී.

විභාග ප්‍රතිඵල එනතුරු අක්කා **ඇඟිලි ගනිමින්** සිටී.

දැනුම මිනුම තරගයෙන් ප්‍රථම ස්ථානය දිනා ගත් ශිෂ්‍යයා **ඕනෑ ම පොතක ඇති දෙයක් මතකයෙන් කීමට** දනී.

දැනුම මිනුම තරගයෙන් ප්‍රථම ස්ථානය දිනා ගත් ශිෂ්‍යයා **පොත් ගුල්ලෙකි.**

පළමු වැකියෙන් කියන අදහස දෙවන වැකියෙන් ඉතා කෙටියෙන් රසවත්ව කියා ඇති අයුරු විමසන්න.

එවැනි රූඪී හඳුනා ගන්න.

අත දෙනවා	උදවු කරනවා
හෙනහුරා ලබලා	නරක කාලයක් උදා වෙලා
ලැල්ලට පෑගුවා	ඉතා වේගයෙන් ගියා
සායම ගියා	ලැජ්ජාවට පත් වුණා
ගොළුබෙලි ගමන	හෙමින් වැඩ කිරීම
දෙහි කපනවා	දොස් පවරනවා
කටු අත්තක්	නිතර දබර කරන අයෙක්
කොළේ වහනවා	යම් කරුණක් සඟවනවා
ඇඟ බේරා ගත්තා	උපායශීලීව මග හරිනවා
එක පයින්	සම්පූර්ණ කැමැත්තෙන්
මර ඇඳේ දී	අන්තිම අවස්ථාවේ
අකුල් හෙළනවා	බාධා කරනවා

යුගල පද

පද දෙකක් හෙවත් පද යුගලයක් එකට යෙදීම යුගල පද නම් වේ. අදහසක් පැවසීමේ දී වඩාත් විචිත්‍රවත්ව හා අවධාරණයෙන් ප්‍රකාශ කිරීම සඳහා සිංහල භාෂා සම්ප්‍රදායේ යෙදෙන යෙදුම් විශේෂයක් ලෙස යුගල පද හැඳින්විය හැකි ය.

"ලොකු අත්තා කොහොම ද ඔය තරම් ලස්සනට **කවි සීපද,** වන්නං කියන්ඩ ඉගෙන ගත්තේ."

"කන්ද උඩරට කීර්ති ශ්‍රී රාජසිංහ මහ රජ්ජුරුවන්ගෙ දේවින්නාන්සෙට වෙදකම කරල තියෙනව, අපේ මී මුත්තෙක්. ඒවට නම්බු නාම, **ගම් බිම්, පදවි තානාන්තර** ලබල තියෙනව. ඒ විතරක් ද **සිල්ප සාස්තරේ** අඳුරනව.

නාට්‍ය කොටසින් උපුටා ගත් ඉහත ප්‍රකාශවල තද කළු අකුරින් දක්වා ඇති යෙදුම්, යුගල පද ලෙස දැක්විය හැකි ය. ඒවායින් කියමන අර්ථවත් කිරීමට ලැබී ඇති සහාය විමසා බලන්න.

යුගල පද සෑදී ඇති විධි කීපයකි.

සමානාර්ථ පද යුගලයක් යෙදීම

මිල මුදල්	සමිති සමාගම්	නැණ නුවණ
වැහි වරුසා	දුගී දුප්පත්	පදවි තානාන්තර
බණ දහම්	වෙහෙර විහාර	ශිල්ප සාස්තරේ
යාන වාහන	කෙළි සෙල්ලම්	රැකී රක්ෂා

විරුද්ධාර්ථ පද යුගලයක් යෙදීම

දුක සැප	උගත් නූගත්	ගුණ දොස්
හොඳ නරක	ඇති නැති	එදා මෙදා
ඈත මෑත	බාල මහලු	එතෙර මෙතෙර
පින් පව්	අඩු වැඩි	අග මුල

එක් පදයක අර්ථ සහිත අනෙක් පදයේ අර්ථ රහිත පද යුගලයක් යෙදීම

බඩු මුට්ටු	මුදල් හදල්	උදව් පදව්
කුලී මලී	පඩි නඩි	තරහ මරහ
ගමන් බිමන්	බාර හාර	ඉඩම් කඩම්
ළමයි බමයි	කුල මල	තොවිල් පවිල්

අර්ථ රහිත පද යුගලයක් යෙදීම (එහෙත් එයින් යම් අර්ථයක් ඉස්මතු වේ)

ලට පට	තක්කු මුක්කු	දනි පනි
ජර මර	ඕප දූප	තොර තෝංචි
ආන පාන	අනං මනං	අඩුම කුඩුම
වං හුං	ලවක් දෙවක්	ලට්ට ලොට්ට

අර්ථය අතින් තරමක් සමීප පද යුගලයක් යෙදීම

ඇට කටු	පොත පත	ළඟ පාත
වතු පිටි	හැළි වළං	කයි කතන්දර
ගේ දොර	නිතී රීති	කොට්ට මෙට්ට
දුගී මගී	ලියුම් කියුම්	හොර බොරු

එකිනෙකට අසමාන පූර්ව ක්‍රියා පද යුගලයක් යෙදීම

සිතා බලා	ලියා කියා	නටා ගයා
දුව පැන	හදා වඩා	උයා පියා
බලා කියා	කර කියා	ගයා වයා
කවා පොවා	තළා පෙළා	සොයා බලා

අවබෝධය

1. I කොටසේ ඇති ප්‍රස්තාව පිරුළට වඩාත් ගැළපෙන යෙදුම II කොටසින් තෝරා ලියන්න.

I කොටස

i. හිඟන්නාගේ පාත්තරේ හෙනහුරා වැටුණා වගේ
ii. අහසට ඉණිමං බඳිනවා වගේ
iii. ලූලා නැති වළට කණයා පණ්ඩිතයා
iv. නියර මිටි තැනින් වතුර බහිනව වගේ
v. ගඟෙන් වතුර බී මුහුදට ආවැඩීම

II කොටස

i. ප්‍රධානියා නැති විට අවශේෂ පුද්ගලයන් ප්‍රධාන වන බව
ii. වැරැද්දේ වගකීම දුබලයාට පැවරීම
iii. කරදරයට පත් වී සිටින විට තවත් කරදරයක් වීම
iv. උපකාර කළ පුද්ගලයා අමතක කර බලවතුන් වර්ණනා කිරීම
v. නිෂ්ඵල ක්‍රියාවක් කරන බව

2. හිස්තැනට යෝග්‍ය පරිදි ගැළපෙන යෙදුම් යොදා පිරුළු සම්පූර්ණ කරන්න.

i. යන යකා .... බිඳ ගෙන යනවලු
ii. දී කිරට .... සාක්කිලු
iii. උණු හින්ද බොන්නත් බෑ .... අහක දාන්නත් බෑ
iv. බල්ලන්ට ....දුන්න වගේ
v. .... ඇත්නම් කොහොම බඳින්න බැරි ද

3. පහත සඳහන් කියුම්වලට ගැළපෙන ප්‍රස්තාව පිරුළු ලියන්න.

i. සැනසිලි පතා කරන දෙයින් පෙර තිබුණාටත් වඩා කරදර පැමිණීම.
ii. තමා වැරදි කරමින් අනුන්ට දැනමුතුකම් දීම
iii. නරක ඇසුර තිබුණත් යහපත් පුද්ගලයා අයහපත් අයකු බවට පත් නො වේ.
iv. යමකුගේ සැබෑ තත්ත්වය පෙනෙන්නේ ඔහුගේ ක්‍රියා කලාපයෙනි.
v. ජන්මයෙන් ලද දුර්ගුණ ඉවත ලිය නො හැකි ය.

4. I කොටසේ ඇති රූඩිවලට ගැළපෙන අර්ථය සහිත කොටස II තීරුවෙන් තෝරා ලියන්න.

I කොටස	II කොටස
i. කඹ අදිනවා	i. ක්‍රියාත්මක නො කිරීම
ii. හමස් පෙට්ටියට දමනවා	ii. රහසින් අනුබල දීම
iii. සුදුහුණු ගානවා	iii. රැකියාව අහිමි කිරීම
iv. බඩට ගහනවා	iv. එකඟතාවක් නැතිකම
v. උල්පන්දන් දෙනවා	v. ඇත්ත වසන් කරනවා

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

5. **මුලින් දී ඇති රූඩීයේ අර්ථයට සමාන තවත් රූඩීයක් වරහන තුළ ඇත. එය තෝරා ලියන්න.**

i. සායම ගියා
ii. දිවෙන් දිව ගාගෙන
iii. අන්තිම ඉත්තත් ඇද්දා
iv. තරු විසිවුණා
v. හැටට හැටේ

(අවසාන තුරුම්පුවත් ගැහුවා, මූණ ඇඹුල් වුණා, පණට පණ, ලෑල්ලට පාගලා, එලොව පොල් පෙනුණා)

6. **දී ඇති රූඩී යොදා අර්ථවත් වාක්‍යය බැගින් තනන්න.**

උදාහරණ: විදේශගතව සිට පැමිණි නිමල් දැන් ජීවත් වන්නේ රජගෙදර පරෙවියා මෙනි.

i. ගිනි ගෙඩියක්
ii. අතමාරුවක්
iii. සේසත ම
iv. අලගු තියන්නවත් බැරි
v. ඉහේ මලක් පිපුණා

7. **පළමුව දක්වා ඇති යුගල පදයේ අර්ථයට සමීප යුගල පදය ඉදිරියේ ඇති යුගල පදවලින් තෝරා ලියන්න.**

i. අහල පහල - සල්ලි බාගෙ
ii. මුදල් හදල් - පඬුරු පාක්කුඩම්
iii. ලිපි ලේඛන - ළඟ පාත
iv. තෑගි බෝග - චාරිත්‍ර වාරිත්‍ර
v. සිරිත් විරිත් - ලියුම් කියුම්

8. **එක් එක් යුගල පද අයත් වන වර්ගය ඉදිරියෙන් තෝරා ලියන්න. එම යුගල පද යොදා වාක්‍ය නිර්මාණය කරන්න.**

උදාහරණ: සමිති - සමාගම් = සමානාර්ථ; ඔහු සමිති සමාගම් රැසක නිල තල හෙබවී ය.

i. මං මාවත්
ii. තක්කු මුක්කු
iii. ඇති නැති
iv. බේත් හේත්
v. වං හුං
vi. දැන උගත්
vii. සද්ද බද්ද
viii. මැහුම් ගෙතුම්
ix. පින් පව්
x. කර කියා

ප්‍රායෝගික අභ්‍යාස

1. **පහත දී ඇති පිරුළුවල උත්පත්ති කතා සොයා ලියන්න.**
   i. කලුවා මාරපන් ගියා වගේ
   ii. රාලහාමි බතල කන්න පොල් තේරුවා වගේ
   iii. අන්දරේ සීනි කෑවා වගේ
2. **ප්‍රස්තාව පිරුළු, රූඩී එහි අර්ථ සහිතව ද, එක් එක් වර්ගයට අයත් යුගල පද ද එක් කර "බස සරසන සාම්ප්‍රදායික යෙදුම්" මැයෙන් පොත් පිංචක් සකස් කරන්න.**